සිසිර දිසානායක

මේ'පුර දස වසරක්

''අකුණු කොටන කොට ගොරවන්න එපා කියලා කොච්චර කිව්වත් අහනව ද?'' පන්හිඳ ගොරනාඩුවක් පටන්ගත්තා.

''කාටද කිව්වේ? මටද? නැත්නම් අහසට ද? පින්සල තක්කු මුක්කු වෙලා.

''මං කිව්වෙ තමුන්නැහේට. රෑ තිස්සේ ගොරෙද්දෙ දෙන්න අදින අදිල්ලට අහක යන අකුණුත් ගෙට ඇදිල එයි කියල මට බය....'' පන් අඟට නොගෙන කිව්වා. කලිං දා රාත්තිරියේ අකුණු ගගහා හරියට වැස්සා.

''තමුන්නැහේට මොකද? අහික් පැත්ත හැරිලා නිදාගන්න එකනෙ තියෙන්නේ.'' රෑ තිස්සේ හින්ද යන්නෙ නැති එකට මං මක් කරන්න ද? ඒ පින්.

''අපොයි ඒ වාසනාවනම් තමුන්නැහේට මඳි නොකියන්න තියෙනවා. ලයිට් කණුවකට හේත්තු කලත් අපූරුවට තින්ද යනවා. මට දැන් කවි සිතුවිල්ලක්වත් පහල වෙන්නෑ තමුන්නැහෙගෙ ගොරොද්දෙ සද්දෙ නැත්නං.....'' පන් ඔලොක්කුවට හිනාවුණා.

''ඇයි කෝච්චි සද්දේ?? පැද්දෙන මේසෙකුත් ගෙනත් දෙන්නයි තියෙන්නෙ තමුන්නැහේට ලියන්න්.'' පින්, පන් පාර අයිනේ තිබිලා චමරියට අරං ආව මේසෙ දිහා බැළුවා. ''කෝච්චියේ ම පන් ලිව්ව තරමක්....''

''මේසෙට නම් හිනා වෙන්න එපා. අවුරුදු දහයක් ලිව්ව මේසෙ.'' ''හැබෑව නේන්නං අවුරුදු දහයක් ඇන්ද මේසේ.'' පින්ටත් මතක් වුණේ එතකොටයි තමුන් මෙහෙට ඇවිත් අවුරුදු දහයක් ගතවුණා කියලා.

පැන්සල ආවෙ පස්සෙ. මීට අවුරුදු කීපයකට කලින් එංගලන්තෙනෙ උන්නෙ. පැන් දෙන්නගෙ කතාව අහන් උන්නා.

''පහුගිය අවුරුදු දහය ගැන මොකද හිතෙන්නෙ?'' පින් තට්ටය අතගෑවා.

''වයසට ගිහින් '' පන් ගත් කටටම කිව්වා.

''ඒක ඉතින් අහන්න දෙයක් යැ? එහෙම නෙවි ගතවුණ කාලෙ ගැන මොකද හිතෙන්නෙ?''

''අනේ මන්දා. ලිව්වා, ලිව්වා අවුරුදු දහයම ලිව්වා. අන්තිමට ලියපු දෙයකුත් නෑ වගේ.'' පන් තමුන්නෙ ලියවිලි ගොනු කරලා තියෙන ෆයිල් කවර දිහා බැළුවා. ඔෆිස් වර්ක්වලින් ගෙනාව ෆයිල් කවරවල ''පහන,'' ''සන්නස'', ''හිරු කිරණ'', ''ටිකිරි'', ''සිහනද'' කියලා ලේබල් ගහලා.

''මට ඒ කාලෙ අම්මා කියපු දෙයක් මතක් වුණා....'' පන් අතීතෙට ගියා.

''ඒ මොකක්ද ඒ ?''

''උඹ නොකරන දේකුත් නෑ. අන්තිමට කරන දේකුත් නෑ...''

''ඇත්ත තමා'' ඒ පැන්.

''ඒ වුණාට ඊට පස්සේ මං කරන දෙයක් ඇත්තං හරියට කරන්න උත්සාහ ගත්තා.....''

''තාමත් උත්සාහ කරනවා මයෙ හිතේ..?'' පින් ඇඟට නොදැනී කිව්වා.

ඔව් ඉතිං පණ තියෙනකල්ම උත්සාහ කරන එක තමයි කරන්න වෙන්නෙ. කොයි තරං දේවල් තියනවද ඉගෙන ගන්නරෑ ලියන්න කලිං කියවන්න මොන තරං දේවල් තියෙනවාද? අර වික්ටර් රත්නායක මහත්තයත් කොයි වෙලෙත් කියන්නේ ඕකනේ.

''ඒ මොකක් ද? පැන් උනන්දු වුණා.

''වදාරන්න කලින් හදාරන්න ඕනෙ කියලා.''

''නිකං කොල පුරවන්නෙ නැතිව ලියන අදින දේ කියවපු රස විඳපු අයට පින් දුන්නොත් නරක ද? පින් යෝජනා කළා.

''ඔව් ඉතින් ඒඅ යට අපි පින් නොදුන්නොත් දෙයියංගෙම පිහිට තමා.....'' පැන් හිනි සැරයක් යැව්වා.

''ඔක්කොට ම කලිං පත්තර පිටු පුරවන්න ඉඩ හදල දුන්න ජගත් ජේ.එදිරිසිංහ මහත්තැන්ට පින් දෙන්න වෙනවා. වරුණ සාවින්ද උන්නැහේවත් මතක් කරන්නම ඕනෙ. ''පහන'' පත්තරේ පටන් ගන්න කාලෙ දුන්න සහයෝගයට. සෙව්වන්දිකා, ශ්‍රීපලි සහෝදරියන්ගේ සංග්‍රහත් අමතක කරන්න බෑ මේ වෙලාවේ.

පත්තර විස්තරේ කියන ගමං පන් ලියන මේසෙට ගිහින් වාඩි වුනේ මොනව හරි ලිව්වනං හොඳාය කියලා හිතිලා වෙන්න ඇති.

මේ'පුර ගත වුණ පසුගිය දස වසර තුළ ලිවීම ප්‍රධාන වශයෙන් දෙයාකාර විය. ලිපි ලිවීමත්, ගීත ලිවීමත් ය ඒ. ලිපි ලිවීම පිළිබඳව සිහි කරනා විට ජගත් හා වරුණ සොයුරන්ට අමතරව, බන්දු හා මිහිරි දිසානායක යුවල, ජය ශ්‍රී චන්ද්‍රපිත්, ටියුඩර් අමරසේන, වෙළින්ටන් මොල්ලිගොඩ, අසෝක සුබසිංහ, විල්ප්‍රඩ් සිරිවර්ධන යන මහත්වරුත්, සරත් හා විජීතා විජේරත්න යුවල හා සුනන්දා තිලකරත්න මහත්මිය දුන් සහය ආදරයෙන් සිහිපත් කරන්නේමු.අගනා උපදෙස් දුන් වි.ක.ධර්මබන්ධු මහත්මාව ද සිහිපත් කළ යුතුයි.

ගී ලිවීම පිළිබඳව සිතතොත් මුලින් ම මා ලියූ ගී තෝරා ගෙන ගැයූ පිරිස, සංගීතය මුනු කළ පිරිස, දර්ශන ගත කළ පිරිස මුලින් ම සිහියට නැගෙයි. නම් වශයෙන් ලිවීමට නොසිතෙන්නේ එයින් ම මෙ පිට පිරි යා හැකි බැවිනි. විශේෂ ස්තුතියක් පිරිහැමිය යුතු පුද්ගලයෙක් ද අප අතර වෙයි. මව් බිමේ දී රසිකයින් අතරට ගියා වූ ගී 19 ක් ඇතුලත් කොට නිෂ්පාදනය වූ ''නුඹෙ සිරිත්කියට'' සංගත තැටියින්, එතෙර මෙතෙර ළමා ගී 20 ක් ඇතුලත් කොට නිෂ්පාදනය වූ ''අතුරු මිතුරු'' සංගතතැටියටත් මූල්‍යමය දායකත්වය දුන් දෙරණ ආහාර මෙරටට ගෙන්වන ඩෙන්සිල් ජයවීර සොයුරායි, ඒ. මෙම සංගත තැටි එළි දැක්වීමේ දී අත දුන් අනුග්‍රාහක සෑම සියලු දෙනාමත්, සංවිධාන කටයුතු කරමින් හා ශිල්පීය දායකත්වය දුන් සෑම සියලු දෙනාවත් සිහිපත් කරන්නේ කෘතවේදීවයි. ගී ප්‍රචාරය සඳහා තෝරා ගත් සියළු ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍යත්, ප්‍රසංගත් මෙම දශකයේ අපව ධෛර්යමත් කිරීමට ඉමහත් සේ රුකුල් දුන්නෝ ය. මුද්‍රිත මාධ්‍යයේත් පවා ගී පිළිබඳවත්, සංගත තැටි පිළිබඳවත්, අප සංවිධානයෙන් දායක වූ ප්‍රසංග පිළිබඳවත් ලියැවිණ. ඒ හැමට ම අපගේ තුති පිරි නැමෙයි.

මුල් කාලයේ පටන්ම අප හා එක්වෙමින් නොයෙක් කටයුතු සඳහා දායක කරගත් පිරිස ද අමතක කළ නොහේ. ඒ අතරින් රෝහණ කරුණාරත්න, උපා උපදාස, මාලනී ජයසිංහ, දොස්තර රංජිත් හෙට්ටිආරච්චි, ප්‍රසන්න නාමල් කුරුකුලරත්න, රමණි ලියනාරච්චි, වාසනා වීරකෝන්, ශිරෝමා ප්‍රනාන්දු, තරපති මුණසිංහ, කුසුම්සිරි ලියනාරච්චි, රසිකා කුලසිංහ, රංගන හා උදුම්බරා යුවල, ලලිත් අරුණශාන්ත, රුක්මන් විමලසූරිය, හර්ෂ බණ්ඩාර ජයලත්, දිනේෂ් අඳපාසිංහ, ආචාර්ය ෂෙල්ටන් ප්‍රේමරත්න යන පිරිස නාමිකව සඳහන් කරනු කැමැත්තෙමු.

සංවිධාන වශයෙන් ගත් කල රෝහිත බෝගහවත්ත සොයුරාගේ සභාපතිත්වයේ පටන් ආනන්ද විද්‍යාලයීය ආදී ශිෂ්‍ය සංගමය, ස්කෑවිස් ආයතනය, ස්පර්ශ සංවිධානය, ශ්‍රී ලංකා - ඕස්ට්‍රේලියා දිවා සුරුකුම්පරියන්ගේ සංගමය, ශ්‍රී ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ ආදී ශිෂ්‍ය සංගමයත් ඇතුලු අනෙක් සෑම සියළු සංවිධානත්, විහාරස්ථ දායක කමිටු, ගුවන් විදුලි කමිටු යනාදියත් අප සමග සහයෝගයෙන් කටයුතු කළ අන්දම සිහිපත් වන කල සිතට දැනෙන්නේ සොම්නසක්මයි.

සංවිධානයට දායක වන්නට ඉඩ ලැබුණා වූ ප්‍රසංග පිළිබඳව ද මතකයට නැගෙයි. පළමු වරට මෙල්බන් කොන්සට් ශාලාවේ ආදී ආනන්දයීයන් වේදිකා ගත කළ ''රන් ස්වර දහරා'', එම ශාලාවේ දීම හර්ෂ පත්නි මිත්‍රයා හා රුක්මන් දෙටු ආනන්දයීයා සමග වේදිකා ගත කළ ''සුරස සුසර'', කැමරන් කොළඹගේ උපා උපදාස හා රෝහණ කරුණාරත්න සොයුරන් මුල් ව වේදිකාගත වූ ''ස'' ප්‍රසංගය, ප්‍රසන්න කුලරත්න හා රොෂාන් ලින්තොටගේ සොයුරන් එක්ව කළ ''මේ'පුර ගී'', වෛද්‍ය රංජිත් හෙට්ටිආරච්චි මහත්මාගේ මූලිකත්වයෙන් කල වික්ටර් රත්නායක උපහාර ප්‍රසංගය, ''තනි තරුවේ'' සඳා මතකයේ රැඳී පවතියි. වික්ටෝරියානු ගායක සංගමය සඳහා වේදිකා සැරසිලි හා පරිපාලන කටයුතුවලින් දුන් දායකත්වයේ අනෙක් පුරුක් දෙක වූයේ ප්‍රියන්ත ප්‍රනාන්දු හා හර්ෂයි. වාසනා වීරකෝන් සංගීතාචාර්යවරියගේ සංඛ පද්ම කලායතනයෙන් ඉදිරිපත් කළ ''ස්වර සංගිතා'' ප්‍රසංගය වඩාත් ශාස්ත්‍රීය මුහුණුවරක් ගත් ප්‍රසංගයයි. එහිදී ගායනයෙන් ද දායක වන්නට වරම් ලැබිණ. දානට ලලිත් අරුණශාන්ත සොයුරාගේ මූලිකත්වයෙන් පැවැත්වෙන ''ආරාධනා'' ගායන කවය ද, වෙසක් සමයේ දී බැති ගී ඉදිරිපත් කරන, කොලින් පල්ලියගුරු සොයුරා පුහුණු කරවන ''සමාධි බැති ගී සරණය ද'' ආදී ආනන්දයීයන් ඉදිරිපත් කළ භක්ති ගීත ගායනය ද අපගේ හිත සුව පිණිස විය.

අප වෙනුවෙන් වෙබ් අඩවි දෙකක් පසුගිය දශකයේ නිර්මාණය විය. ''තුම්මන්සල'' වෙබ් අඩවියට අනුබද්ධිතව උයද ගෝචින්න සොයුරා නිර්මාණය කළ වෙබ් අඩවියත්, දිල්හාන් පද්මරත්න සොයුරා නිර්මාණය කළ ''සිසාරා'' (අඅඅගිසීරගජප්ප)අඩවියත් ය ඒ. ඒ සඳහා වූ කපවම් සියැසින් ම දුටුවෙමු, අපි. ඊට පින්. ''සිසාරා'' වෙබ් අඩවිය සඳහාත්, ''අතුරු මිතුරු'' සංගත තැටියේ කංප්‍රකය හා පොත් පිංච සඳහාත් නිර්මාණ දායකත්වය දුන් සුමිත් හා දේවිකා දෙපළ ද ආදරයෙන් සිහිපත් කරන්නෙමු. ''සිසිරගේ කුරුවු ගී'' පුස්තකය සඳහා කංචුකය පරිඝනකයෙන් සකස් කර දුන්නේ ජගත් ජේ.එදිරිසිංහ සොයුරායි. ''නුඹෙ සිරිත්කිය'' සංගත තැටිය එළි දැක්වීමේ උළෙලේ ප්‍රදර්ශනයට දර්ශන සකස් කර දුන්නේ වරුණ සාවින්ද සොයුරායි. ඔවුන්ට තුති. ''ඉතින් කියවුණා ද ළය ගිනි ?'' ළමා චිත්‍රපටයේ එකම ළමා ගීය ''අතුරු මිතුරු'' ගීතය ලිවීමට ඇරයුම් කළ ශිරෝමා ප්‍රනාන්දු සොයුරියටත් එම දර්ශන ''අතුරු මිතුරු'' සංගත තැටිය එළි දැක්වීමේ උළෙලට සකස් කර දුන් එහි අධ්‍යක්ෂක රුක්මාල් නිරෝෂ් සොයුරාටත්, ''අතුරු මිතුරු'' ළමා ප්‍රසංගය සංගීතවත් කළ තරපති මුණසිංහ සොයුරා ඇතුළු සැමටත් ස්තුති කළ යුතුව තිබේ. එහි කථනයට දායක වූ ශ්‍රීනාත් මඳුමගේ සොයුරාත්, නිමිමා රූපසිංහ දියණිය ඇතුළු අනෙක් දරු දරියන් සියල්ලමත් ආදරයෙන් සිහිපත් කරන්නෙමු. ඒ ඊට දායකත්වය දුන් සියලු දෙමව්පියන්, ගුරුවර ගුරුවරියන් හා රංගන ශිල්පි ශිල්පිනියන්ව ද සිහිපත් කරනා අතරේදීයි.

මුද්‍රිත මාධ්‍ය වශයෙන්, පහන, සන්නස, සිහනද, සෙරන්ඩිම්, ටිකිරි, දෘෂ්‍ය මාධ්‍ය වශයෙන් ''චානල් 31'', ''වරුණ මල්යි මීඩියා'', ශ්‍රීලාල්, ශ්‍රව්‍ය මාධ්‍ය වශයෙන්, 'ත්‍රී ටිපල් ඉසෙඩ්'', එස්.බී.එස්, සිහල එෆ්.එම්, සිංහලෙන් පැය දෙකක්, ''වොයිස් ඔෆ් ලංකා'', ස්වර්ණ එෆ්.එම්, ලක්හඬ, ලක්මිහිර වැනි ආයතන පසුගිය දස වසර පුරා දුන් සහය කෘතවේදීව සිහිපත් කරන්නෙමු. ශ්‍රී ලංකන් ඉන්වෙස්ට් හි හේමාල් හා රත්නා ගුරුසිංහ ගෙන් ද ලැබෙන්නේ නොමඳ සහයකි.

අප හට පොත පත ළං කර දෙමින් හා ගුරු හරකම් දෙමින් අපව දිරිමත් කරනා, පූජ්‍ය නා ඔටුන්නේ විජිත හිමියන්, පූජ්‍ය අකරවිට සංඝානන්ද හිමියන්, මහාචාර්ය ප්‍රියාන් මෙන්ඩිස් මහත්මා, ආනන්දයේ ආදී ශිෂ්‍යයකු මෙන්ම ගුරුවරයකු වූ රංජිත් සොයිසා මහත්මා ඇතුළු එවන් සෑම සියළු දෙනාම ද අදරින් සිහිපත් කරන්නෙමු.

(අපගේ බොහෝ සත්කාරක කටයුතුවලට උර දෙන මහේන්දු කාලිංගමුදලි පන්ති මිත්‍රයා මෙන්ම මේ'පුර වෙසෙන විස්සකට අධික පන්ති මිත්‍ර කැළ සිහිපත් නොකළ හොත් වන ආනිසංසය දැන් කියාම ඇඟපතට දැනෙන්නා සේය.)

මීට දසවසරකට පෙර අප මෙහි ගෙන්වා ගෙන රැකවරණය දුන් පද්මාගේ සොයුරිය රංජනී හා ඇගේ සැමියා වන සැමසන් ඒකනායක යුවලත්, වැඩිහිටියන් සේ අප හට ඔවා දෙන ධර්මි හා ප්‍රේමා කටුගම්පල යුවලත්, පොත පත දැනුම බෙදා හදාගන්නා ඔවුනගේ පුත්, සුමින්ද සොයුරාත් සිහිපත් කරන්නේ පින් අනුමෝදන් කරමිනි.

අවසන අප කරන, කියන, ලියන, අඳින දේ විඳින්නා වූත්, අපේ වරද උපේක්ෂාවෙන් ඉවසන්නා වූත්, අඩු පාඩු පෙන්නා දෙන්නාවූත් ඔබ සෑම වෙත අපගේ භක්තිගාදරය පිරිනැමෙයි.

''අනේ ඉතින් ලියන්න මගහැරුණා දෙයක් හරි නමක් හරි වුනොත් තරහ වෙන්න නම් එපා. පත්තරේට යවන්න හදිස්සියෙයි මේ ලිව්වේ...''

එන් කෝකටත් කියලා එහෙම කිව්වේ හැමෝවම නම්වලින් මතක් කරන්න ගියොත් තවත් පිටු ගණනක් ලියන්න වෙන නිසා වෙන්නත් ඇති.

සන්නස
බලන්නට ඇති පත්තර අතර
කියවන්නට ඇති පත්තරයක්